සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය
## ව්‍යවසායකත්ව අධ්‍යයනය - I

**නම/විභාග අංකය :-- ..................................................................................... කාලය : පැය 01 යි.**

**සැලකිය යුතු යි.**

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **1 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයේ ප්‍රශ්න අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(1) ව්‍යාපාර අදහසක් හඳුනාගෙන එහි යම් ප්‍රායෝගික ව්‍යාපාර කටයුත්තක් බවට පරිවර්තනය කරන්නා,
(1) කළමනාකරුවා වේ. (2) නායකයා වේ.
(3) ව්‍යවසායකයා වේ. (4) ව්‍යාපාරිකයා වේ.

(2) ''රටතුළ පවතින ආරක්ෂිත තත්ත්වය අනුව පාසල් බෑග් නිෂ්පාදන ආයතනයක් විනිවිද පෙනෙන ආකාරයේ පාසල් බෑග් නිෂ්පානය කර වෙළඳපොළට සැපයීමෙන් අධික ලාභයක් ලැබීමට සමත් විය'' නිෂ්පාදන ආයතනය සිදු කර ඇත්තේ,
(1) අභියෝග වලට සාර්ථකව මුහුණ දීමකි.
(2) පරිසරයේ ඇති අවස්ථා හඳුනා ගනිමින් නවෝත්පාදන සිදු කිරීමකි.
(3) කෙටි කාලයක් තුළ ව්‍යාපාරික අරමුණු සාක්ෂාත් කර ගැනීමකි.
(4) සාර්ථක ව්‍යාපාරයකට අඩිතාලමක් දමා ගැනීමකි.

(3) නව්‍යතා සම්පාදනය සිදු වන්නේ,
(1) නිර්මාණශීලීත්වය තුලිනි. (2) ස්වාධිනත්වය තුලිනි.
(3) නම්‍යශීලීත්වය තුලිනි. (4) අනුකරණය තුලිනි.

(4) ''ඇතැම් ව්‍යාපාරිකයන් විශ්වාස හා ආකල්ප කෙරෙහි තදබල ලෙස ගැලී සිටී.'' මෙය,
(1) නිර්මාණශීලීත්වයට බාධා කාරී වන්නකි. (2) තම ස්වාධීනත්වය තහවුරු කර ගැනීමකි.
(3) අවධානම කළමනාකරණය කර ගැනීමකි. (4) සමාජ සම්මතයන්ට එරෙහි වීමකි.

(5) ව්‍යවසායකයෙකු නව්‍යතා සම්පාදන කාර්යයේ නිරත වන විට,
(1) තරඟයකට මුහුණ දේ. (2) ණය ලබා ගැනීමකට යොමු වේ.
(3) අවධානමකට මුහුණ දේ. (4) ලාභ උපරිම කරගැනීමකට යොමු වේ.

(6) ''ව්‍යවසායකයා සෑම විටම නිදහස් මත දැරීමට කැමැත්තක් දක්වයි.'' මෙය,
(1) ආත්ම විශ්වාසය වේ. (2) නම්‍යශීලීත්වය වේ.
(3) අභිප්‍රේරණය වේ. (4) ස්වාධීනත්වය වේ.

(7) පසුගාමී අදහස් හෝ සෘණ ආකල්ප වලින් තොරව තම ව්‍යාපාරයේ අනාගතය පිළිබඳව යහපත් ආකාරයට දැකීම ව්‍යවසායකයෙකු තුළ පවතින කිනම් ගති ලක්ෂණයක්ද?
(1) පරිසර සංවේදී බව වේ. (2) නම්‍යශීලී බව වේ.
(3) සුභවාදී වීම වේ. (4) ස්වයංපෙළඹවීම වේ.

(8) ව්‍යවසායකයෙකු විසින් භාරගන්නේ,

(1) ඕනෑම අවධානමක් ය.
(2) ප්‍රතිලාභයක් නොමැති අවධානමක් ය.
(3) අවිනිශ්චිත බවක් නොමැති අවධානමක් ය.
(4) සාර්ථක වීමේ වැඩි ප්‍රවණතාවයක් ඇති වගකීම් ය.

(9) ''ව්‍යවසායකත්ව සංවර්ධනය තුලින් රැකියා අවස්ථා ජනනය වීමක් සිදු වේ.'' මෙය, ව්‍යවසායකත්වයේ,

(1) ජාතික මට්ටමේ ප්‍රතිලාභයක් වේ.
(2) ප්‍රාදේශීය මට්ටමේ ප්‍රතිලාභයක් වේ.
(3) ග්‍රාමීය මට්ටමේ ප්‍රතිලාභයක් වේ.
(4) පෞද්ගලික මට්ටමේ ප්‍රතිලාභයක් වේ.

(10) කළමණාකරුවෙක් තම ව්‍යවසායකයාගේ තීරණ ක්‍රියාත්මක කරන අතර ව්‍යවසායකයෙකු,

(1) කළමණාකරුගේ තීරණ ක්‍රියාත්මක කරයි.
(2) ගනුදෙනුකරුවන්ගේ තීරණ ක්‍රියාත්මක කරයි.
(3) තමාගේම තීරණ ක්‍රියාත්මක කරයි.
(4) සමාජ තීරණ ක්‍රියාත්මක කරයි.

11, 12, 13, 14 යන ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් විස්තරය සැලකිල්ලට ගන්න.

''පරිසර විශ්ලේෂණයකින් පසු සහන් අබේනායක පරිගණක අලුත් වැඩියා කිරීමේ ව්‍යාපාරය 'සහන් ඩොට් කොම්' නමින් ලියාපදිංචි කර ඇත.

(11) 'සහන් ඩොට් කොම්' යනු,

(1) කේවල ස්වාමී ව්‍යාපාරයකි
(2) හවුල් ව්‍යාපාරයකි.
(3) සමිති සංවිධාන ව්‍යාපාරයකි.
(4) වරලත් ව්‍යාපාරයකි.

(12) ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කර ඇත්තේ,

(1) සමාගම් රෙජිස්ටාර් කාර්යාලයෙන් ය.
(2) අදාල ප්‍රාදේශීය සභාවෙන් ය.
(3) අදාල ප්‍රාදේශීය ලේකම් කර්යාලයෙන් ය.
(4) කාර්මික සංවර්දන මණ්ඩලයෙන් ය.

13) 'සහන් ඩොට් කොම්' ව්‍යාපාරය හා බැඳුනු අභ්‍යන්තර පරිසර සාධකයක් වන්නේ,

(1) ව්‍යාපාරයට පැමිණෙන ගනුදෙනුකරුවන් ය.
(2) ව්‍යාපාරයට මූල්‍ය පහසුකම් සපුරා ඇති බැංකුවය.
(3) තරඟකාරී ව්‍යාපාර වල සිටින තරඟකරුවන් ය.
(4) එහි සිටින සේවක පිරිස් ය.

(14) පරිගනක අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් සහන් අබේනායක තුළ පවතින දක්ෂතාවය,

(1) තාක්ෂණික කුසලතාවය වේ.
(2) මානව කුසලතාවය වේ.
(3) සංකල්පනාත්මක කුසලතාවය වේ.
(4) උපදේශන කුසලතාවය වේ.

(15) නිර්මාණාත්මක ව්‍යවසායයක අදහසක් සඳහා නීතිමය ආවරණය සලසා ගත හැකි වන්නේ,

(1) එස්. එල්. එස් (SLS) ප්‍රමිති සමතිකය මඟිනි.
(2) පේටන්ට් (ස්වාධිකාර) බලපත්‍රය මඟිනි.
(3) ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය මඟිනි.
(4) තත්ත්ව සහතිකය මඟිනි.

(16) ආරම්භ කරනු ලබන කුඩා ව්‍යාපාර වලින් සැලකිය යුතු ප්‍රමාණයක් කෙටි කාලයක් තුළ වැසීයාමට ලක් වේ. මෙසේ වන්නේ,

(1) කේවල ස්වාමී ව්‍යාපාර ලෙස පවත්වාගෙන යාම හේතුවෙනි.
(2) පවුලේ සමාජිකයින්ගේ දායකත්වය ලබා ගැනීම හේතුවෙනි.
(3) සැලසුම් සහගත බවින් තොරව කටයුතු කිරීමෙනි.
(4) මහා පරිමාණ ව්‍යාපාර වල නිෂ්පාදිත ගුණාත්මක බවින් වැඩිවීම හේතුවෙනි.

(17) ව්‍යාපාර සංවිධානයක දක්නට ලැබෙන පොදු ලක්ෂණයක් වන්නේ,

(1) ලියාපදිංචි කර තිබීම වේ. (2) සම්පත් භාවිතා කිරීම වේ.

(3) නීතිමය පුද්ගලභාවයක් තිබීම වේ. (4) වගකීම අසීමිත වීම වේ.

(18) ''දේශීය ලොකු ළූණු අස්වැන්න ලබන කාලයේ දී ආනයනය කරනු ලබන ලොකු ළූණු කිලෝග්‍රෑමයකට රු. 40 ක ආනයන බද්දක් පැනවීමට රජය විසින් තීරණය කර ඇත. '' ආනයන බදු පැනවීම අයක් වන්නේ,

(1) ආර්ථික පරිසරයට ය. (2) ගෝලීය පරිසරයට ය.

(3) දේශපාලන හා නෛතික පරිසරයට ය. (4) ආසන්න පරිසරයට ය.

(19) ආනයන කරනු ලබන ලොකු ළූණු වල බදු පැනවීම දේශීය ලොකු ළූණු නිෂ්පාදකයාට,

(1) තර්ජනයක් වේ. (2) අභියෝගයක් වේ.

(3) අවස්ථාවක් වේ. (4) ශක්තියක් වේ.

(20) 'දිළිඳු පවුල් වල දරුවන්ට ශිෂ්‍යත්ව ලබා දීමට කටයුතු කිරීම', ව්‍යවසායකයෙකුගේ,

(1) සමාජයීය සුභසාධනයට දායක වීමකි. (2) මූල්‍ය ප්‍රතිලාභ පෞද්ගලිකව හිමිකර ගැනීමකි.

(3) ආදායම් බෙදීයාමේ විෂමතාව අවම කිරීමකි. (4) ප්‍රාදේශීය සංවර්ධනයට දායක වීමකි.

(21) ''ජනාකීර්ණ පරිසරයක පවත්වාගෙන යනු ලබන සුදත් ගේ ව්‍යාපාරය ස්වයං සේවා අලෙවි ක්‍රමයකට පරිවර්ථනය කර ප.ව. 10.00 වන තෙක් ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යයි. මේ අනුව සුදත්,

(1) සමාජයීය ව්‍යවසායකයෙකි. (2) සාමාන්‍ය ව්‍යාපාරිකයෙකි.

(3) අභ්‍යන්තර ව්‍යවසායකයෙකි. (4) ව්‍යාපාර ව්‍යවසායකයෙකි.

(22) පාරිභෝගික හැසිරීම සම්බන්ධයෙන් සිදුකරන විශ්ලේෂණයක පොදු ආකල්ප, වටිනාකම් හා ජීවන රටාවක් ඇතුලත් කරන පරිසරය,

(1) ප්‍රජා පරාසරය වේ. (2) සමාජ හා සංස්කෘතික පරිසරය වේ.

(3) ගෝලීය පරිසරය වේ. (4) විද්‍යාත්මක හා තාක්ෂණික පරිසරය වේ.

(23) ''ව්‍යවසායකයෙකු විසින් තම නිෂ්පාදිත තෝරාගත් පාරිභෝගික කණ්ඩායමක් සඳහා ඉදිරිපත් කළ යුතු වේ. '' මෙහි සඳහන් වන තෝරා ගත් පාරිභෝගික කණ්ඩායම යනු,

(1) ඉලක්ක ගත පාරිභෝගික කොටස වේ. (2) ආදායම් උපයන පාරිභෝගික කොටස වේ.

(3) තාර්කික පාරිභෝගික කොටස වේ. (4) වෙළෙඳපොළ හිඩැස වේ.

(24) ''සමාන ගුණාංග පදනම් කර ගනිමින් වෙළඳ පොළ කොටස් කිරීම'' යනු,

(1) වෙළඳපොළ සමීක්ෂණය කිරීමකි. (2) වෙළඳපොළ කණ්ඩනය කිරීමකි.

(3) අලෙවි උපාය මාර්යයකි. (4) වෙළඳපොළ ඉලක්ක ගත කිරීමකි.

(25) ස්වංක්‍රීය ටෙලර් මැෂිම (ATM) මගින් මුදල් තැන්පතු සිදු කිරීම සඳහා ATM කාඩ්පත් හිමියන්ට අවස්ථාව ලබා දීම.

(1) නව සේවාවක් පවත්නා වෙළඳපොළකට ඉදිරිපත් කිරීමකි.
(2) පවත්නා සේවාවක් නව වෙළඳපොළකට ඉදිරිපත් කිරීමකි.
(3) නව සේවාවක් නව වෙළඳපොළකට ඉදිරිපත් කිරීමකි.
(4) පවත්නා සේවාවක් පවත්නා වෙළඳපොළකට ඉදිරිපත් කිරීමකි.

පහත සිද්ධිය කියවා අංක 26 සිට 30 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

''හංසලී වෙලඳපොළ විශ්ලේෂණයකින් පසු නව්‍යතාවයෙන් යුතු කාන්තා අත් බෑග් නිෂ්පාදනය කර සාධාරණ මිලකට අලෙවි කිරීමටත් ප්‍රාදේශීය වෙළඳපොළ ඉල්ලුමෙන් 15% ක් අත්පත්කර ගැනීමටත් අපේක්ෂා කරයි. අරලිය ෆැෂන් නමින් ව්‍යාපාරය ලියාපදිංචි කිරීමටත් එන්ටප්‍රයිසස් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ රු.මිලියන 4ක ණය මුදලක් ලබා ගැනීමටත් අදහස් කරයි.

(26) වෙළඳපොළ විශ්ලේෂණයට වැය කරන මුදල්

(1) කාරක ප්‍රාග්ධන වියදමකි. (2) ස්ථාවර ප්‍රාග්ධන වියදමකි.
(3) මෙහෙයුම් පෙර ආයෝජන වියදමකි. (4) නිෂ්පාදන පිරිවැය අයිතමයකි.

(27) ව්‍යාපාර ලියාපදිංචිය තුලින් ලබා ගත හැකි වාසියක් වනුයේ,

(1) පාරිභෝගිකයන් ආකර්ෂණය කර ගැනීමට හැකි වීමය.
(2) ව්‍යාපාරයට නෛතික පිළිගැනීමක් ඇතිවීම ය.
(3) ව්‍යාපාර සේවකයන්ට වඩාත් හොඳ සුරක්ෂිත බවක් ලැබීමය.
(4) ව්‍යාපාරයේ කීර්තිනාමය වර්ධනය වීමය.

(28) වෙළඳපොළ ඛණ්ඩනයට යොදා ගෙන ඇති පදනම වනුයේ,

(1) සමාජ පසුබිම ය. (2) වයස් ව්‍යුහයයි.
(3) ආදායමකි. (4) ස්ත්‍රීපුරුෂ භාවයයි.

(29) කාන්තා අත්බෑග් සාධාරණ මිලකට ලබා දීම,

(1) ව්‍යාපාර ආචාර ධර්ම අනුගමනය කිරීමකි. (2) ව්‍යාපාර තරඟයකට මුහුණදීමට හැකිවීමකි.
(3) ව්‍යාපාර නීති අනුගමනය කිරීමකි. (4) ව්‍යාපාරික අරමුණු ඉටුකරගැනීමට යොමු වූවකි.

(30) හංසලී ඉටුකර ගන්නේ කාන්තාවන්ගේ ,

(1) අවශ්‍යතා ය. (2) අපේක්ෂාවන් ය. (3) වුවමනා ය. (4) රුචිකත්වයන් ය.

(31) නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තුවකට ඇතුළත් කරන පිරිවැය අයිතමයක් වනුයේ,

(1) පරිපාලන සේවක වැටුප් ය. (2) විකුනුම් සේවක වැටුප් ය.
(3) නිෂ්පාදන සේවක වැටුප් ය. (4) නිෂ්පාදන ස්ථාවර වත්කම් වල පිරිවැයයි.

(32) පහත හිස්තැන සඳහා යෙදිය යුතු නිවැරදි පිළිතුර තෝරන්න.

| සෘජු ද්‍රව්‍ය වියදම් | + | ................. | + | වෙනත් නිෂ්පාදන වියදම් | = | මුළු නිෂ්පාදන පිරිවැය |
|---|---|---|---|---|---|---|

(1) නිෂ්පාදන නොවන පිරිවැය. (2) සෘජු ශ්‍රම පිරිවැය.
(3) නිෂ්පාදන ස්ථාවර වත්කම් වල පිරිවැය. (4) ඒකකයක නිෂ්පාදන පිරිවැය

(33) ව්‍යාපාර සැලසුම් වලින් දක්වෙන්නේ,

(1) අතීත මූල්‍ය තොරතුරු ය. (2) අතීත විකුණුම් තොරතුරු ය.
(3) අතීත නිෂ්පාදන පිරිවැය තොරතුරු ය. (4) අපේක්ෂිත තොරතුරු ය.

(34) ඉදිරි කාල සීමාවක් සඳහා අපේක්ෂිත මුදල් ගලා ඒම් හා අපේක්ෂිත මුදල් ගලායෑම් ඇතුළත් කරනු ලබන වාර්තාව,

(1) ප්‍රධාන මුදල් පොත වේ. (2) මුදල් ප්‍රවාහ සැලැස්ම වේ.
(3) ආදායම් ප්‍රකාශනය වේ. (4) මූල්‍ය ඇස්තමේන්තුව වේ.

(35) ව්‍යවසායක කළමනාකරුවෙකු වැටුප් හෝ වේතන උපයන අතර ව්‍යවසායකයා හිමිකර ගන්නේ,

(1) ආදායම් හා වියදම් ය. (2) පොළී හා ලාභාංශ ය.
(3) ලාභ හෝ අලාභ ය. (4) කොමිස් හා වට්ටම් ය.

(36) ''ලක්මාල්, විදේශීය සංචාරකයින් සඳහා සුබෝපභෝගී බස්රථ සේවාවක් පවත්වාගෙන යයි.'' ලක්මාල්ගේ ව්‍යාපාරික කටයුත්ත,

(1) ප්‍රාථමික අංශයට ඇතුළත් වේ. (2) ද්විතීයික අංශයට ඇතුළත් වේ.
(3) තෘතියික අංශයට ඇතුලත් වේ. (4) ජාත්‍යන්තර සේවා කටයුතු අංශයට ඇතුළත් වේ.

(37) ව්‍යාපාරිකයින් මිල අඩු කර (සේල් ක්‍රමය) භාණ්ඩ තොග විකිණීමට යොමු වීම .

(1) භාණ්ඩ ප්‍රචාරණය කිරීමකි. (2) අලෙවි උපාය මාර්ග අනුගමනය කිරීමකි. (3) ඉක්මනින් මුදල් සම්පාදනය කර ගැනීමකි. (4) වෙළඳ වට්ටම් ලබා දීමකි.

(38) ඉදිරි මාසය තුළ දී විශ්‍රාම යාමට නියමිත රෝහිනී මහත්මියට ලැබීමට නියමිත විශ්‍රාම පාරිතෝෂික මුදල 15% වාර්ෂික පොලිය ලබා දෙන ජ්‍යෙෂ්ඨ පුරවැසි ගිණුමක තැන්පත් කිරීමට අපේක්ෂා කරන අතර ඒ සඳහා රාජ්‍ය වාණිජ බැංකුවක් තෝරා ගනී. රෝහිනී මහත්මියගේ ආයෝජනයේ,

(1) අවධානම ඉහළ මට්ටමක ඇත.

(2) අවධානම හා ප්‍රතිලාභය යන දෙකම ඉහළ මට්ටමක ඇත.

(3) අවධානම පහළ වන අතර ප්‍රතිලාභය ඉහළ මට්ටමක ඇත.

(4) අවධානම ඉහළ වන අතර ප්‍රතිලාභය ශූන්‍ය වේ.

(39) ව්‍යවසායක අලෙවි උපායමාර්ග සංවිධානය කිරීම තුළින් අලෙවි ඉලක්ක සපුරාලීමේ වගකීම,

(1) ගණකාධිකාරීවරයා සතු වේ.

(2) මූල්‍ය කළමනාකරු සතු වේ.

(3) අලෙවි කළමනාකරු සතු වේ.

(4) පරිපාලන නිලධාරියා සතු වේ.

(40) ව්‍යවසායකයෙකු විසින් වර්දනය කරගත යුතු කුසලතා හා ඊට අදාල නිදසුන් පහත දැක්වේ. (නිදසුන් දක්වා ඇත්තේ අනුපිළිවෙලින් නොවේ.)

| කුසලතා | නිදසුන් |
|---|---|
| i. සංකල්පනාත්මක කුසලතා | A. රැස්වීම් පැවැත්වීම |
| ii. මානව කුසලතා | B. නව වෙළඳ පොළ සොයා ගැනීම |
| iii. සන්නිවේදන කුසලතා | C. සේවකයින් අභිප්‍රේරණය |

කුසලතා අනුපිළිවෙලට අනුව නිදසුන් අනුපිළිවෙළින් දැක්වූ විට නිවැරදි වන්නේ,

(1) B, C හා A ය. (2) A, C හා B ය.

(3) C, B හා A ය. (4) B, A හා C ය.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය 2019

## 11 ශ්‍රේණිය

## ව්‍යවසායකත්ව අධ්‍යයනය - II

කාලය : පැය 02 යි.

නම/විභාග අංකය :-- ..................................................................................

I පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) පහත දී ඇති සිද්ධිය හොඳින් කියවා (අ) හි (i), (ii), (iii), (iv), (v) යන කොටස් හා (ආ) කොටසටද පිළිතුරු සපයන්න.

නිර්මාණශීලී නොපසුබට උත්සහයෙන් යුතු හා පැහැදිලි දැක්මක් ඇති දයාසිරි මහතා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් මෙහෙයවනු ලැබූ බේකරි නිෂ්පාදන පාඨමාලාව සාර්ථකව නිමකරන ලදී. නව්‍යතාවයෙන් යුත් කේක් නිෂ්පාදනය කර සාධාරණ මිලකට අලෙවි කිරීම සඳහා තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට දයාසිරි මහතා යොමු විය. 'දයා බේකර්ස්' නමින් ව්‍යාපාරය ලියාපදිංචි කිරීමට රු. 8000 ද, ව්‍යාපාර සැලැස්ම සැලසීමට රු. 20000 ද වැය කළ යුතු වේ. පහත තොරතුරු ද පවතී.

- තම පියාගෙන් උරුම වූ, ♦ ගොඩනැගිල්ල රු. 500 000
  ♦ ලී බඩු රු. 300 000
- රු. ලක්ෂ 25 ක බැංකු ණයක් ලබා ගෙන රු. ලක්ෂ 20කට කුඩා කැබ්රථයක් මිලදී ගෙන ව්‍යාපාරික කටයුතු සඳහා යොදවා ගනී.
- ආරම්භයේ දී පුහුණු ශ්‍රමිකයින් දෙදෙනෙකුගේ සහය ලබා ගනී.
- දෛනික ව්‍යාපාරික කටයුතු සඳහා රු. 30 000 ක් වැය කළ යුතු වේ.

'දයා බේකර්ස්' නමින් පවත්වා ගෙනයන ව්‍යාපාරය නොබෝකාලයකින් සීමා සහිත පෞද්ගලික සමාගමක් බවට පත්කරලීමට දයාසිරි බලාපොරොත්තු වේ.

(අ) (i) දයාසිරි මහතා තුළින් පෙන්නුම් කෙරෙන ව්‍යවසායකත්ව ගති ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
(ii) 'දයා බේකරිස්' නමින් පවත්වාගෙන යන ව්‍යාපාරය අයත් වන ව්‍යාපාර සංවිධාන ප්‍රභේදය හා ව්‍යාපාරික නාමය ලියා පදිංචි කළ යුතු ස්ථානය ලියන්න.
(iii) මෙම ව්‍යාපාරය සතුව පවතින 'ශක්තීන්' දෙකක් ඉදිරිපත් කරන්න.
(iv) කේක් නිෂ්පාදනයේ දී දැරීමට සිදුවන පිරිවැය අයිතම හතරක් සඳහන් කරන්න.
(v) ව්‍යාපාරය සීමා සහිත පෞද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමේ දී අයදුම් පත්‍රයට අමතරව ඉදිරිපත් කළයුතු ලියවිලි දෙකක් සඳහන් කරන්න.

(ආ) පහත දැක්වෙන ආකෘතියට අනුව ආයෝජන ඇස්තමේන්තුව සම්පූර්ණ කරන්න. (රු.)

| අයිතමය | අයිතිකරුවන් යොදවන | ණය මඟින් | මුළු ආයෝජනය |
|---|---|---|---|
| ස්ථාවර වත්කම් | | | |
| ♦ | | | |
| ♦ | | | |
| ♦ | | | |
| මෙහෙයුම් පෙර ආයෝජනය | | | |
| ♦ | | | |
| ♦ | | | |
| කාරක ප්‍රාග්ධනය | | | |
| ♦ | | | |
| එකතුව | | | |

ල. (අ) = 10
(ආ) = 10
= 20

(02) (i) ව්‍යවසායකත්වය හා ප්‍රාග්ධනය අතර පවත්නා වෙනස්කම් දෙකක් ඉදිරිපත් කරන්න.

(ii) ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා ව්‍යවසායකයා තුළ පැවතිය යුතු පෞරුෂීය ගති ලක්ෂණ 4ක් සඳහන් කරන්න.

(iii) ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් ව්‍යවසායකයාට හා සමාජයට අත්වන ප්‍රතිලාභ දෙක බැගින් ඉදිරිපත් කරන්න.

(iv) ව්‍යවසායකයා තුළ තිබිය යුතු සමාජ වගකීම් දෙකක් හා පාරිභෝගිකයාට ඇති වගකීම් දෙකක් වෙන වෙන දක්වන්න.

(v) බාහිර පරිසරය තුළින් ව්‍යවසායකත්ව සංවර්ධනයට එල්ල විට හැකි අවාසිදායක බලපෑම් 4ක් සඳහා නිදසුන් ඉදිරිපත් කරන්න.

(ලකුණු 2X5=10)

(03) (i) ව්‍යවසායකයකු ඉටු කරන භූමිකා වලින් 2ක් නම් කරන්න.

(ii) පහත සඳහන් එක් එක් කාර්යයට අදාළව ව්‍යවසායකයෙකු විසින් වර්ධනය කර ගත යුතු මූලික කුසලතාවය කවරේද? යන්න සඳහන් කරන්න.

**<u>කාර්ය</u>**

(අ) අනාගත ව්‍යාපාරික කටයුතු සාර්ථක කරගැනීමට අවශ්‍ය වන තීරණ ගැනීම.

(ආ) සේවකයින් අතර මතුවන මතභේද වල දී ඔවුන්ට නිවැරදි මඟපෙන්වීම් ලබා දීම.

(iii) ව්‍යාපාර කටයුතු සඳහා භාවිතා කරන පහත සඳහන් සම්පත් යටතේ බෙදීයන මූලික කොටස් දෙක බැගින් දක්වන්න.

(අ) මානව සම්පත්

(ආ) මානව නොවන සම්පත්

(iv) නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර ව්‍යවසායකයකු විසින් ගත යුතු තීරණ වලින් 4ත් ඉදිරිපත් කරන්න.

(v) ශ්‍රී ලංකා ආර්ථිකයේ පවතින ප්‍රධාන ව්‍යාපාර අවශ්‍යතා වලින් දෙකක් නම් කර ඊට නිදසුන බැගින් ඉදිරිපත් කරන්න. (ල: 2×5= 10)

(04) (i) ව්‍යාපාර අදහස් හා ව්‍යාපාර අවස්ථා අතර ඇති සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

(ii) හොඳ ව්‍යාපාර අවස්ථාවක දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් ඉදිරිපත් කරන්න.

(iii) ව්‍යාපාර අදහසක් විශ්ලේෂණය කිරීමට යොදා ගත හැකි ''ශදඅත'' විශ්ලේෂණයක පවතින වාසිදායක සාධක සහ අවාසිදායක සාධක වෙන වෙනම දක්වන්න.

(iv) (අ) ව්‍යවසායකයකුට තම නිර්මාණාත්මක ව්‍යාපාර අදහසක් ආරක්ෂා කර ගැනීමට ගත හැකි නීතිමය ආවරණ පහසුකම කවරක්ද?

(ආ) එම නීතිමය ආවරණ තුළින් ව්‍යවසායකයාට ලබා ගත හැකි වාසියක් ලියන්න.

(v) කාන්තාවන්ගේ විනෝදාංශ හා ලැදියා තුළින් මතු කර ගත් ව්‍යාපාර අවස්ථා සඳහා නිදසුන් 4ක් ඉදිරිපත් කරන්න.

(ල: 2×5= 10)

(05) (i) ඕනෑම ව්‍යාපාර සංවිධානයක් තුළ දක්නට ලැබෙන පොදු ලක්ෂණ 4ක් ලියන්න.

(ii) පහත සඳහන් දෑ සම්බන්ධයෙන් ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා කටයුතු කරන අන්දම ඉදිරිපත් කරන්න.

(අ) ව්‍යාපාරික කටයුතු වල යෙදීම.

(ආ) ඉලක්ක ඇති කර ගැනීම.

(iii) නූතන ව්‍යාපාර පරිසරය තුළ දක්නට ලැබෙන ප්‍රවණතා 4ක් සඳහන් කරන්න.

(iv) පහත නිර්ණායක (පදනම්) අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කළ හැකි ආකාර ඉදිරිපත් කරන්න.

(අ) අයිතිය අනුව

(ආ) අරමුණ අනුව

(v) ශ්‍රී ලංකා ආර්ථිකය තුළ කුඩා පරිමාණ ව්‍යාපාර වල වැදගත්කම සනාථ කෙරෙන කරුණු 4ක් ඉදිරිපත් කරන්න.

(ල: 2×5= 10)

(06) 'ව්‍යාපාරික අරමුණු හා එම අරමුණු ඉටුකරගන්නා ආකාරය පෙන්නුම් කෙරෙන ලේඛනය' ව්‍යාපාර සැලැස්මක් වේ.

(i) ව්‍යාපාර සැලසුම් කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව දෙකක් සඳහන් කරන්න.

(ii) ව්‍යවසායකයාට ව්‍යාපාර සැලැස්මක් වැදගත් වන්නේ කුමන ආකාරයකට ද? යන්න කරුණු දෙකකින් ඉදිරිපත් කරන්න.

(iii) ළමා ඇඳුම් අලෙවියට අදාලව ඉරිදි මාස තුන සඳහා අලෙවි ඇස්තමේන්තුවක් පිළියෙළ කිරීමේ දී ඊට ඇතුළත් කෙරෙන මූලික කරුණු 4ක් දක්වන්න.

(iv) ඒකකයක පිරිවැය ඇස්තමේන්තුව පහත පරිදි වේ.

| | (රු.) |
|---|---|
| ද්‍රව්‍ය පිරිවැය | 25 |
| ශ්‍රම පිරිවැය | 18 |
| නිෂ්පාදනයට අදාල වෙනත් වියදම් | 17 |
| විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් | 15 |

ඉහත තොරතුරු වලට අනුව,

(අ) ඒකකයක නිෂ්පාදිත පිරිවැය කොපමණද?

(ආ) පිරිවැය අයිතම පැහැදිලිව දැක්වෙන සේ ඒකක 2000 සඳහා නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන්න.

(ල (i), (ii), (iii) සඳහා 2 5 3 = 6
(iv) සඳහා = 4
= 10)

(07) (i) සමන් සහ අරුණ රු. 150 000 බැගින් යොදා පාසල් පොත් හා ලිපිද්‍රව්‍ය මිලට ගෙන අලෙවි කිරීම සඳහා කුඩා ව්‍යාපාරයක නිරත වීමට අදහස් කරති. 2020 ජනවාරි 1 දින ආරම්භ කිරීමට නියමිත ව්‍යාපාරයේ ජනවාරි මාසයේ ඇස්තමේන්තු පහත දැක්වේ.

| | (රු.) |
|---|---|
| අභ්‍යාස පොත් හා ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම් | 80 000 |
| විදුලිය හා වෙනත් වියදම් | 12 000 |
| අභ්‍යාස පොත් හා ලිපි ද්‍රව්‍ය විකිණීමෙන් | 145 000 |
| ලී බඩු උපකරණ මිලදී ගැනීම් | 28 000 |
| වෙනත් ආදායම් ලැබීම් | 7 000 |
| කඩකුලී ගෙවීම් | 8 000 |

2020/1/31න් අවසන් මාසය සඳහා ඇස්තමේන්තු ගත මුදල් ගලා ඒම් හා ඇස්තමේන්තු ගත මුදල් ගලා යැම් පැහැදිලිව පෙන්නුම් වන සේ මුදල් ප්‍රවාහ සැලැස්ම පිළියෙළ කර 2020/1/31 දිනට මුදල් ශේෂය ගණනය කර පෙන්වන්න.

(ලකුණු 05)

(ii) සමන් හා අරුණ ආරම්භ කළ ව්‍යාපාර සංවිධානය කුමක්ද? එම ව්‍යාපාර සංවිධානයෙහි පවතින වගකීම් සම්බන්ධයෙන් කුමක් කිව හැකි ද? (ලකුණු 02)

(iii) රු. 400 000 බැංකු ණය මුදලක් ලබා ගැනීමට අපේක්ෂා කරන අතර ඒ සඳහා ඉදිරි මාස තුනකට අදාළ ආදායම් ප්‍රකාශනයක් ලබා දීමට සිදු වේ යැයි සිතන්න. එවැනි ආදායම් ප්‍රකාශනයක ඇතුළත් විය යුතු මූලික කරුණු තුනක් දක්වන්න. (ලකුණු 03)

Answer

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය
## ව්‍යවසායකත්ව අධ්‍යයනය - පිළිතුරු පත්‍රය

### I පත්‍රය (බහුවරණ)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | (3) | 11. | (1) | 21. | (3) | 31. | (3) |
| 02. | (2) | 12. | (3) | 22. | (2) | 32. | (2) |
| 03. | (1) | 13. | (4) | 23. | (1) | 33. | (4) |
| 04. | (1) | 14. | (1) | 24. | (2) | 34. | (2) |
| 05. | (3) | 15. | (2) | 25. | (1) | 35. | (3) |
| 06. | (4) | 16. | (3) | 26. | (3) | 36. | (3) |
| 07. | (3) | 17. | (2) | 27. | (2) | 37. | (2) |
| 08. | (4) | 18. | (3) | 28. | (4) | 38. | (3) |
| 09. | (1) | 19. | (3) | 29. | (1) | 39. | (3) |
| 10. | (3) | 20. | (1) | 30. | (3) | 40. | (1) |

20ක් නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 01 x 40 = 40 කි.

### II පත්‍රය

(01) (අ) (i) • නිර්මාණශීලී බව
• නොපසුබට උත්සහය
• දැක්මක් ඇතිව කටයුතු කිරීම.
කැපවීම.
(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 2කට ලකුණු 02 යි)

(ii) • කේවල ස්වාමී ව්‍යාපාරය/තනි පුද්ගල/ඒක පුද්ගල
• අදාල ප්‍රාදේශීය ලේකම් කර්යාලය
(ලකුණු 02 යි.)

(iii) • හිමිකර කේක් නිෂ්පාදනය සම්බන්ධයෙන් වෘත්තීය පුහුණුවක් ලබා දීම.
• කේක් නිෂ්පාදනය සඳහා පුහුණු ශ්‍රමිකයින් සිටීම.
• ප්‍රාග්ධන ශක්තිය/මූල්‍ය ශක්තිය පැවතීම.
(කරුණු 2කට ලකුණු 02යි.)

(iv) • පිටි, රසකාරක, සීනි, සැකරින්, ආදී ද්‍රව්‍ය පිරිවැය
• කේක් නිෂ්පාදන ශ්‍රමික වැටුප්, අත් උදව් කරුවන්ගේ වැටුප්
• කම්මල් කුලී, විදුලි ගාස්තු, ඉන්ධන වියදම, කම්මල් යන්ත්‍රය, කම්මල් අළුත්වැඩියා පිරිවැය
ආදී වෙනත් නිෂ්පාදන පිරිවැය.
(පිරිවැය අයිතම 4කට ලකුණු 2ක් දෙන්න.)

(v) • සාංගමික් (සමාගමක) ව්‍යවස්ථාවලිය
• සමගමේ නම වෙනත් සමගමක නමක් නොවන
බවට ප්‍රකාශය
• සමාගමේ අධ්‍යක්ෂ වරුන් ලෙස කටයුතු කිරීමට
කැමති බවට ප්‍රකාශය
• සමාගමේ ලේකම් ලෙස කටයුතු කිරීමට කැමති
බවට ප්‍රකාශය
(කරුණු 2කට ලකුණු 02යි)

(ආ)

ආයෝජන ඇස්තමේන්තු (රු.)

| අයිතමය | අයිතිකරුවන් යොදවන | ණය මගින් | මුළු ආයෝජනය |
|---|---|---|---|
| ස්ථාවර වත්කම් | | | |
| ♦ ගොඩනැගිලි | 500 000 — (1) | | 500 000 — (1/2) |
| ♦ ලී බඩු උපකරණ | 300 000 — (1) | | 300 000 — (1/2) |
| ♦ මෝටර් රථ (කැබ්රථ) | | 2 000 000 — (1) | 2 000 000 — (1/2) |
| | | | 2 800 000 |
| මෙහෙයුම් පෙර ආයෝජනය | | | |
| ♦ ව්‍යාපාර ලියාපදිංචිය | 8 000 — (1) | | 8 000 — (1/2) |
| ♦ ව්‍යාපාර සැලසුම් සැකසීම. | 20 000 — (1) | | 20 000 — (1/2) |
| කාරක ප්‍රාග්ධනය | | | |
| ♦ දෛනික කටයුතු සඳහා මුදල් | 30 000 — (1) | | 30 000 — (1/2) |
| | | | 2 858 000 — (1) |
| එකතුව | | | |

(ලකුණු 10)

(02) (i)

| ව්‍යවසායකත්වය | ප්‍රාග්ධනය |
|---|---|
| • සජීවී සාධකයකි. | • සජීවී සාධකයක් නොවේ. |
| • ප්‍රතිලාභය පොළිය වේ. | • ප්‍රතිලාභය ලාභ හෝ අලාභ වේ. |
| • සම්පත් භාවිතා කර නව නිෂ්පාදන බිහිකිරීමක් සිදු වේ. | • මිනිසාගේ මැදිහත්වීම මත නිපදවූ නිෂ්පාදන ආධාරක වේත |

(වෙනස්කම් දෙකකට ලකුණු 02 යි.)

(ii)
- නිර්මාණශීලී බව
- ස්වාධීනත්වය
- නම්‍යශීලීත්වය
- කැපවීම
- සුභවාදී බව
- නායකත්වය
- අධිෂ්ඨානශීලී බව
- අභිප්‍රේරණය
- ඉවසීම
- ගතානුගතික නොවීම.

(කරුණු 4ට ලකුණු 02 යි.)

(iii) <u>ව්‍යවසායකයාට</u>
- අදායම්/ලාභ වැනි මූල්‍ය ප්‍රතිලාභ හිමිවීම.
- කීර්ති ප්‍රශංසාව, ගෞරවයට පත් වීම.
- නිදහස
- සමාජ පිළිගැනීමට ලක්වීම.
- ස්වාධීනත්වය
- ආත්ම තෘප්තිය

(කරුණු 2කට ලකුණු 01යි)

<u>සමාජයට</u>
- රැකියා අවස්ථා ජනනය වීම.
- නව භාණ්ඩ හා සේවා පරිභෝජනයට ලැබීම.
- තරඟකාරීත්වය තුළින් භාණ්ඩ විශාලවශයෙන් නිපදවීම නිසා ඒවායේ මිල අඩුවීමෙන් පාරිභෝගිකයාට වාසියක් ලැබීම.

(කරුණු 2කට ලකුණු 01යි)

(iv) <u>සමාජ වගකීම්</u>
- නිසි ලෙස රජයට බදු ගෙවීම.
- සමාජය විසින් පොදුවේ භාවිතා කරන යටිතල පහසුකම් සංවර්ධනයට දායක වීම.
  උදා: පාරවල්, පරිසර සංරක්ෂණය
- දිළිඳු පවුල් සඳහා ආධාර ලබා දීම.
  උදා: නොමිලේ පොත්පත්, ශිෂ්‍යත්ව, සනීපාරක්ෂක පහසුකම්.

(වෙනත් පිළිගත හැකි කරුණු)
(කරුණු දෙකකට ලකුණු 01 යි)

<u>පාරිභෝගිකයාට</u>
- සාධාරණ මිලකට භාණ්ඩ ලබා දීම.
- අවංකව කටයුතු කිරීම.
- කිරුම් මිනුම් ආදී උපකරණ නිසි ප්‍රමිතියකින් යුතුව භාවිතා කිරීම.
- වංචනික ක්‍රියාවල නොයෙදීම.
- පාරිභෝගික ගරුත්වය රැකෙන ලෙස ක්‍රියා කිරීම.

පිළිගත හැකි වෙනත් කරුණු .....
(කරුණු දෙකකට ලකුණු 1යි)

(v)
- රජය විසින් ව්‍යාපාර මත බදු පැනවීම.
- ව්‍යවසායකයින්ට සපයන නය වෙනුවෙන් දැඩි කොන්දේසි හෝ අයකරන පොලී ප්‍රතිශත ඉහළ දැමීම.
- තරඟකාරී වෙනත් ව්‍යාපාර වල උපාය මාර්ග වෙනස් කිරීම.
- ජාතීන් අතර, සංස්කෘතීන් අතර මතභේද ඇතිවීම./ ගැටුම් ඇතිවීම.
- බැංකු ණය පොලී අනුපාතයන් ඉහළ දැමීම.
- ගංවතුර, නියගය, භූමිකම්පා වැනි ස්වභාවික සංසිද්ධි මත ඇති වන බලපෑම්
- විවිධ ද්‍රව්‍ය නිෂ්පාදිත අඩුමිලට ආනයනය කර, දේශීය වෙළඳපොළේ අඩු මිලට විකිණීම.

(පිළිගත හැකි වෙනත් කරුණු....)
(කරුණු 04කට ලකුණු 02යි.)
(ප්‍රශ්න අංක 02කට මුළු ළකුණු 10 යි.)

**Answer**

(03) (i)
- අයිතිකරුගේ භූමිකාව
- කළමණාකරුගේ භූමිකාව
- නායකයාගේ භූමිකාව

(කරුණු 02කට ලකුණු 02යි.)

(ii) (අ) සංකල්පනාත්මක කුසලතාවය (ල. 01)
(ආ) උපදේශන කුසලතාව (ල. 01)

(iii) (අ) <u>මානව සම්පත්</u>
- කළමනාකරුවන්
- කළමනාකරුවන් නොවන සේවකයන්

(ල. 01)

(ආ) <u>මානව නොවන සම්පත්</u>
- ස්වභාවික සම්පත්
- ඛණිජ සම්පත්
- සංස්කෘතික සම්පත්
- ස්වභාවික වනාන්තර
- සත්ත්ව සම්පත

(කරුණු 2කට ලකුණු 01යි)

(iv)
- ව්‍යාපාරය සඳහා කොතරම් කැපවිය හැකිද?
- ව්‍යාපාරයට පදනම් වන භාණ්ඩය හෝ සේවාව කුමක්ද?
- ඉලක්ක ගත පාරිභෝගිකයෝ කවුද?
- ඉපයීම් ප්‍රමාණවත්ද?
- තරඟයේ ස්වභාවය කෙසේ ද?
- ප්‍රාග්ධනය සපයා ගන්නේ කෙසේද?
- ව්‍යාපාර සංවිධාන ප්‍රභේදය කුමක්ද?
- ව්‍යාපාරය පිහිටුවන ස්ථානය කොතනද?
- ව්‍යාපාරයට අවශ්‍ය භාණ්ඩ සේවකයින් ආදිය සපයා ගන්නේ කෙසේද?

(පිළිගතහැකි වෙනත් කරුණු....)
(කරුණු හතරට ලකුණු 2යි)

(v)
- ප්‍රාථමික අංශය : නිදසුන්,
  - කෘෂි කර්මය
  - සත්ත්ව පාලනය
  - ධීවර කර්මාන්තය
  - පතල් හා කැණීම් කටයුතු
  - දැව කර්මාන්තය
- ද්විතීයික අංශය : නිදසුන්,
  - නිෂ්පාදන කර්මාන්ත (ඇඟළුම්, සපත්තු, පොත් ආදී)
  - ඉදිකිරීම් (ගොඩනැගිලි පාලම් ආදී....)
- තෘතියික අංශය : නිදසුන්,
  - තොග හා සිල්ලර වෙළඳාම
  - බැංකු සේවා
  - රක්ෂණ සේවා
  - ගබඩා සේවා
  - ප්‍රවාහන සේවා

(ව්‍යාපාර අංශ දෙකකින් නිදසුනක් සමඟ පවතී නම් ලකුණු දෙකක් දෙන්න.)

(04) i)
- ව්‍යාපාර අදහස් තුළින් ව්‍යාපාර අවස්ථා උදා වීම.
- එම ව්‍යාපාර අදහස් ව්‍යාපාර අවස්ථා බවට පත්කර ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි වීම.

(ව්‍යාපාර අදහස් හා ව්‍යාපාර අවස්ථා අතර සම්බන්ධත්වය ලබා දෙන පිළිතුරට ලකුණු 02 දෙන්න.)

ii) • ව්‍යාපාරයක් ලෙස සංවර්ධනය කළ හැකි වීම.
• පරිසරයේ මතුවන අවශ්‍යතා සපුරාලිය හැකි වීම.
• තරඟකාරීත්වයට සාර්ථකව මුහුණුදිය හැකි වීම.
• තාක්ෂණය සමග ගැලපීම.
• මුහුණු දෙන අවදානම අවමවීම.
• ඉපයීමක් කළ හැකිය.
• තම ව්‍යාපාර අදහස ආරක්ෂා කරගත හැකි වීම.
(කරුණු දෙකකට ලකුණු 2ක් දෙන්න.)

iii) ශදූඅත
වාසිදායක සාධක • ශක්ති
• අවස්ථා (ල.01)
අවාසිදායක සාධක • දුර්වලතා
• තර්ජන (ල.01)

iv) (අ) පේටන්ට් (ස්වාධිකාර) බලපත්‍රය ලබා ගැනීම. (ල. 01)

(ආ) වාසි
• වලංගු කාලය තුළ පේටන්ට් බලපත්‍ර හිමිකම වෙනත් පාර්ශවයකට ලබා දී මුදලක් ඉපයීම කළ හැකිය. (ල. 01)

v) • රූපලාවන්‍ය පාඨමාලා/මධ්‍යස්ථාන පවත්වාගෙනයාම.
• බඳුන්ගත මල් වගාව
• පැකට් කරන ලද රස කැවිලි නිෂ්පාදන
• ළමා ඇඳුම් නිෂ්පාදන
• පෙර පාසල්
• දිවා සුරැකුම් මධ්‍යස්ථාන
(පිළිගත හැකි වෙනත් කරුණු....)
(කරුණු 4කට ලකුණු 02යි)

(05) i) • අරමුණක් පැවතීම.
• සංවිධාන ව්‍යුහයක් තිබීම.
• සම්පත් යොදවා තිබීම.
• ආර්ථික කටයුත්තක නියැලීම
• ගනුදෙනු සිදුවීම.
• පැවැත්ම ගැන සිතීම
• අවදානම් දැරීම
• තරඟයට මුහුණ දීම.
(පිළිගත හැකි වෙනත් කරුණු....)
(කරුණු 4කට ලකුණු 02යි)

ii) (අ) ව්‍යාපාරික කටයුතු වල යෙදීම
ව්‍යාපාරිකයා : ගතානුගතික/ සාම්ප්‍රදායික ක්‍රමයට වීම.
ව්‍යවසායකයා : පාරිසරික වෙනස්කම් සැලකිල්ලට ගනිමින් නවෝත්පාදන බිහිකිරීම (ල. 01)

(ආ) ඉලක්ක ඇති කර ගැනීම
ව්‍යාපාරිකයා : ආයතනික ඉලක්ක/ කෙටිකාලීන ඉලක්ක වේ.
ව්‍යවසායකයා : දිගුකාලීන/දූරදර්ශී ඉලක්කවේ. (ල. 01)

iii) • මිනිස් අවශ්‍යතා හා උවමනා සංකීර්ණ වී තිබීම.
• පාරිභෝගිකයින් දැනුවත්ව සිටීම.
• ව්‍යාපාරික තරඟය අධික වීම.
• ලාභ අරමුණ ට අමතරව සුභසාධක අරමුණ ද ව්‍යාපාරික ප්‍රජාව අතර පැවතීම.
• ගෝලීය වශයෙන් පැතිරී තිබීම.
• තාක්ෂණික උපකරණ භාවිතය වැඩිවීම.
• වෙනස්වීමේ වේගය වැඩි වීම.
(පිළිගත හැකි වෙනත් කරුණු....)
(කරුණු 4කට ලකුණු 02යි)

iv) (අ) අයිතිය අනුව: • පෞද්ගලික අංශයට අයත් ව්‍යාපාර
• පොදු (රාජ්‍ය) අංශයට අයත් ව්‍යාපාර
(ල. 01යි)

(ආ) අරමුණ අනුව: • ලාභ ලැබීමේ අරමුණින් කටයුතු කරන ව්‍යාපාර
• සුබසාධන අරමුණින් කටයුතු කරන ව්‍යාපාර
(ල. 01 යි)

v) • කුඩා පරිමාණ තුළින් රැකියා අවස්ථා බිහිවී තිබීම.
• විශාල පරිමාණ ව්‍යාපාර වලින් නොසැපයීමෙන් භාණ්ඩ හා සේවා ලබා ගත හැකිය.
• පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා වලට අනුව නිෂ්පාදන ලබා ගත හැකි වීම.
• බොහෝ විට අලුත්/නව නිෂ්පාදන ලබා ගත හැකි වීම.
• ණය පදනම යටතේ භාණ්ඩ හා සේවා ලබා ගත හැකි වීම.
• ජාතික නිෂ්පාදිතය වැඩි කිරීමට කුඩා ව්‍යාපාර ඉවහල් වීම.
(පිළිගත හැකි වෙනත් කරුණු....)
(කරුණු 4කට ලකුණු 02යි)
(ප්‍රශ්න අංක 05ට මුළු ලකුණු 10යි)

(06) i) • අයිතිකරුවන්, හිමිකරුවන්, ව්‍යවසායකයින්
• කළමණාකරුවන්
• මූල්‍ය ආයතන (බැංකු වැනි)
(කරුණු 2කට ලකුණු 02යි)

ii) • ව්‍යාපාර සඳහා මඟ පෙන්වීම.
• ව්‍යාපාර පරිසරය අවබෝධ කරගත හැකි වීම.
• ව්‍යාපාරයක් අනාගත දිශාව පෙන්නුම් කිරීම.
• ව්‍යාපාරයක් මූල්‍ය අවශ්‍යතා හඳුනාගත හැකි වීම.
• වෙළඳපොළ පිළිබඳ තක්සේරුවක් ලබා ගත හැකි වීම.
• ව්‍යාපාරයක් සාර්ථක අසාර්ථක බව දැනගත හැකි වීම.
• ව්‍යාපාරයකට අවශ්‍ය සම්පත් හඳුනාගැනීම.
(පිළිගත හැකි වෙනත් කරුණු....)
(කරුණු 2කට ලකුණු 02යි)

iii) ඉදිරි මාස 3ට අදාලව
• ළමා ඇඳුම් අලෙවි වන ප්‍රමාණය (ඒකක ලෙසට)
• ළමා ඇඳුම් අලෙවියෙන් අපේක්ෂිත ආදායම (පිරිවැටුම)
• ළමා ඇඳුම් අලෙවි ආදායම් හා සම්බන්ධ වියදම්
• අලෙවි ස්ථාවර වත්කම්
(කරුණු 4කට ලකුණු 02යි)

**Answer**

iv) (අ) ඒකකයක නිෂ්පාදන පිරිවැය

| | | |
|---|---|---|
| • ද්‍රව්‍ය පිරිවැය (රු.) | 25 | |
| • ශ්‍රම පිරිවැය (රු.) | 18 | |
| • නිෂ්පාදනය අදාළ වෙනත් වියදම් | 17 | |
| | 60 | (ල.01) |

v) නිෂ්පාදන ඒකක 2000 සඳහා නිෂ්පාදන පරිවැය ඇස්තමේනතුව

| | | |
|---|---|---|
| • ද්‍රව්‍ය පිරිවැය (2000X25) | 50 000 | (ල.01) |
| • ශ්‍රම පිරිවැය (2000X18) | 36 000 | |
| • නිෂ්පාදනය අදාල වෙනත් වියදම් (2000X17) | 34 000 | |
| මුළු නිෂ්පාදන පිරිවැය | 120 000 | (ල.01) |

(ප්‍රශ්න අංක 6 ට මුළු ලකුණු 10 යි.)

(07) i)

සමන් හා අරුණ ව්‍යාපාරය
2020/1/31 න් අවසන් වූ මාසය සඳහා ඇස්තමේන්තු ගත මුදල් ප්‍රවාහ සැලැස්ම (ල.01)

| | | | |
|---|---|---|---|
| **මුදල් ගලා ඒම්** | | | |
| • ප්‍රාග්ධනය සැපයීම | 300 000 | | |
| • පොත් හා ලිපි ද්‍රව්‍ය විකිණීමෙන් | 145 000 | | (ල.01) |
| • වෙනත් ආදායම් | 7 000 | | |
| | | 452 000 | |
| **මුදල් ගලා යෑම්** | | | |
| • අභ්‍යාස පොත් මිලදී ගැනීම් | 80 000 | | (ල.01) |
| • විදුලිය හා වෙනත් වියදම් | 12 000 | | |
| • ලී බඩු උපකරණ ලදී ගැනීම් | 28 000 | | (ල.01) |
| • කඩකුලී ගෙවීම් | 8 000 | | |
| | | 1/2(128 000) | |
| 2020/1/31 දිනට මුදල් ශේෂය (ශුද්ධ මුදල්) 1/2 | | 324 000 | |

(ලකුණු 05 යි )

ii) • හවුල් ව්‍යාපාරය ල. 01
• අසීමිත වගකීමක් වේ. ල. 01

iii) ඉදිරි මාස තුනට අදාලයි.
• ව්‍යාපාරික කටයුතු වලින් ඉපයීමට අපේක්ෂිත ආදායම් වේ.
• ආදායම් බිහිකරලීමට දායක වූ වියදම්
• ශුද්ධ ලාභය
(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 03 යි)
(ප්‍රශ්න 07 ට මුළු ලකුණු 10යි.)